# 13. ප්‍රේමයේ විශිෂ්ටත්වය

**යහපත් කිතුනුවකු වීම සඳහා සපුරාලිය යුතු විශේෂ ගුණාංග දෙකක් හඳුනා ගත හැකි ය. එනම් දෙවි පියාණන් වහන්සේ කෙරෙහි පවත්වාගත යුතු ඇදහිල්ලත් උන්වහන්සේ හා අසල්වැසියා වෙත දැක්විය යුතු ප්‍රේමයත් ය. මේ අතුරින් ප්‍රේමයෙහි වැදගත්කම ජේසුස් වහන්සේ අවධාරණය කළ ආකාරය මෙම පාඩමෙන් විමසා බලමු.**




මුතු ඇටයක් සේ අගනා
මහා සයුර මෙන් නිම නොවනා
කිතුනු දිවිය ඔපවත් කරනා
විශිෂ්ට ගුණාංගයකි නිතිනා

**මේ ගුණාංගය කුමක් දැ යි ඔබ දන්නවා ද ?**

ඒ ප්‍රේමය නමැති වටිනා ගුණාංගය යි. කිතුනුවන් ලෙස අප අපට ප්‍රේම කරන්නාක් මෙන් අන් අය හට ද ප්‍රේමය දැක්වීම දෙවියන් වහන්සේගේ අපේක්ෂාව යි.

**කිතුනුවන් ලෙස අන් අය හට ප්‍රේමය දැක්විය හැකි හොඳම මග කුමක්ද ?**

ජේසුස් වහන්සේ මේ සඳහා පිළිතුරු සැපයීමට රසවත් අගනා උපමාවක් යොදාගත් සේක. ඊට මග සැලසුණේ, ජේසුස් වහන්සේ පරීක්ෂා කිරීම සඳහා පැමිණි විනයධරයකු මගිනි.

විනයධරයා:
ගුරු දේවයෙනි හිමි කර ගැනුමට - සදාකාල ජීවනයේ උරුමය
කළ යුතු දේ කිව මැන දැන් මා හට - පමා නොවී එය ඉටු කරලන්නට

ජේසුස් වහන්සේ:

ව්‍යවස්ථාවෙහි ලියා තිබෙන්නේ - කිමෙක් ද ඔබ දැන් කියන්න මා හට
කෙලෙස ද ඔබ එය තේරුම් ගන්නේ-කිනම් ලෙස ද එය වටහා ගන්නේ.

විනයධරයා:

ඔබේ මුළු හදින් ආත්මයෙන් - වීර්යයෙන් හා නුඹේ බුද්ධියෙන්
දෙවි සමිඳුන්ටත් අසල්වැසියටත් - ප්‍රේම කළ යුතුයි සැමදාමත්

ජේසුස් වහන්සේ:

නිවැරදි වේ ඔබ පැවසූ පිළිතුර - එලෙසම කටයුතු කළ යුතු වේ
ජීවත් වනු ඇත මෙලොවෙහි දිගු කල්- ජීවත් වේ ඔබ මේ පොළොවේ

**විනයධරයා තමා නිවැරදි බව ජේසුස් වහන්සේ ඉදිරියෙහි දැක්වීමට කැමති විය.**

විනයධරයා:

කවුරු ද මාගේ අසල්වාසියා - කවුරු ද මාගේ අසල්වාසියා
ගුරු දේවයිනි කිව මැන මා හට - කවුරු ද මාගේ අසල්වාසියා

ව්‍යවස්ථාව දැන සිටිය ද එහි නියම අර්ථය පිළිබඳ නිසි අවබෝධයක් නොතිබූ මෙම විනයධරයා හට ප්‍රේමයේ විශිෂ්ටත්වය පිළිබඳ අනගි පාඩමක් කියා දීමට ජේසුස් වහන්සේ යහපත් සමාරිතයාගේ උපමාව පැවසූ සේක.

## උපමාවට පසුබිම

**ජුදෙව් හා සමාරීය ජාතීන් අතර බොහෝ කලක් තුළ මුල් බැසගත් වෛරයකි, අසමගියකි. ජේසුස් වහන්සේ මෙය නොරිස්සූ සේක.**

ජුදෙව් මිනිසෙක් ගමනක් යන්නේ
ජෙරුසලමෙන් ජෙරිකෝව බලානේ
සොරු මුළකට ඔහු අසු වන්නේ
මහ කරදරයකි සිදු වන්නේ



13.1 රූපය - ජුදෙව් මිනිසකු සොර මුලකට අසු වී



සොරු ඔහු වස්ත්‍ර පැහැර ගන්නේ
තලා පෙළා අඩපණ කොට යන්නේ
අසරණයා වේදනා විඳින්නේ
කව්දැයි ඔහු පිහිට ට දැන් එන්නේ

13:2 රූපය - සොරු වස්ත්‍ර පැහැර ගෙන අසරණයා මග හැර යයි

**ජුදෙව් පූජකවරු - දේව මාළිගාවේ වත් පිළිවෙත් ඉටු කළ පිරිසයි.**

ඒ මග පූජකයෙකි දැන් එන්නේ
වැටී සිටින මිනිසා නෙත ගැටුණේ
පාරෙ අනෙක් පැත්තට ඔහු යන්නේ
අසරණයට නැහැ උදව් කරන්නේ

**ලෙවී ගෝත්‍රිකයන් - දේව මාළිගයේ නමස්කාර සේවයේ යෙදී සිටිය අයයි.**

ලෙවියෙක් ඒ පාරෙන් දැන් යන්නේ
මිනිසා දැක ඔහු අහක බලන්නේ
කිසිවකු ඔහු හට සහය නොවන්නේ
අසරණ මිනිසා යළි තනි වන්නේ

**සමාරිතවරුන් - ජුදෙව්වරුන් බැබිලෝනියට පිටුවහල් කළ විට සමාරියට පැමිණ පදිංචි වූ කණ්ඩායම යි. ජුදෙව්වන් විසින් ඔවුන් ප්‍රතික්ෂේප කරන ලදි.**



සමාරිතයකු යි ඒ මග යන්නේ
මිනිසා දැක එතැනට ළං වන්නේ
ඔහු හද අනුකම්පාවෙන් පිරුණේ
හනිකට මිනිසට උදව් කරන්නේ

13:3 රූපය - සමාරිය ජාතිකයා ජුදෙව්වාට උපකාර කරමින්




13:4 රූපය - සමාරීය ජාතිකයා ජුදෙව්වා
තානායමට රැගෙන යාම

තුවාල බැඳ තෙල් මිදි යුෂ ගල්වන්නේ
තමාගේ කොටළුවා පිට හිඳුවන්නේ
තානායමකට ඔහු ගෙන යන්නේ
ආදරයෙන් රැකවරණය දෙන්නේ

තානායම්කරු වෙත ඔහු යන්නේ
රිදී කාසි දෙකකුත් ගෙන දෙන්නේ
මිනිසා ඔහු හට භාර කරන්නේ
යළි ආ විට වැඩි මුදල ගෙවන්නේ




13:4 රූපය - සමාරීය ජාතිකයා ජුදෙව්වා
තානායමට බාර දීම

ජේසුස් වහන්සේ:
සොරුන් අතට අසුවූ ඒ මිනිසට - අසල්වැසියා වූයේ කවරෙක්දෝ ?
ඔබ සිතනා ලෙස පිළිතුරු දුන මැන - අසල්වැසියා කව්දැයි දැන් කිව මැන

විනයධරයා:
යමකු ඔහුට ප්‍රේමය දැක්වූයෙ ද - දයාව දක්වා උදව් කළේහි ද
අසල්වැසියා නම් ඒ මිනිසා ම ය - උදව් කළේ ආදරය නිසා ම ය

ජේසුස් වහන්සේ:
ඔබත් ගොසින් ඒ විලසින් කරනු - ප්‍රේමය දයාව සැමට දක්වනු
ප්‍රේමය පිරි ජීවිතයක් ගෙවනු - ප්‍රේමයෙ බලය ම ලොවට දන්වනු

**දෙවියන් වහන්සේට හා අසල්වැසියාට ප්‍රේම කිරීම සඳහා**
**තමාම කැපවීමෙන් හා වැයවීමෙන් ප්‍රේමය ක්‍රියාවට නැංවිය යුතු ය.**
**ඒ සඳහා ජේසුස් වහන්සේ ම අපට මග දක්වන සේක.**
**බඩගිනි අයට ආහාර සැපයීමෙන්, පිපාසිත වූවන්ට බීමට දීමෙන්**
**ආගන්තුකයින් නිවසට පිළිගැනීමෙන්**
**වස්ත්‍ර නැති අයට වස්ත්‍ර ලබා දීමෙන්**
**රෝගාතුරයින් රැක බලා ගැනීමෙන්, සිරගත වූවන් බලන්නට යෑමෙන්**
**ප්‍රේමය ක්‍රියාවට නැංවිය හැකි ය.**

**ඒ සඳහා,**

**යහපත් සමාරිත ජාතික මිනිසාගෙන් මග පෙන්වීම් හා ආදර්ශ ලබමින් අපි**

- ❊ තරාතිරම් නොබලා සෑම කෙනකු වෙත ම අපගේ නිරන්තර සැලකිල්ල යොමු කරමු.
- ❊ අපට ඇති සම්පත් අන් අයගේ අවශ්‍යතා වෙනුවෙන් වැයකරමු.
- ❊ සෑම විට ම ප්‍රේමයෙන් අන් අයගේ ජීවිත නගා සිටුවීම සඳහා කැප වෙමු.
- ❊ ප්‍රති උපකාර අපේක්ෂාවෙන් තොර ව උපකාර අවශ්‍ය අයට සහාය වෙමු.

එම ප්‍රේමය තවත් අර්ථවත් කරලීම සඳහා, ජේසුස් වහන්සේගේ ප්‍රේමයේ විශිෂ්ට ආදර්ශයට අපි යොමු වෙමු.

**උන්වහන්සේ, තරාතිරම් නොබලා සෑම කෙනකු පිළිගැනීමෙන්**
**උපකාර අවශ්‍ය සෑම කෙනකුට ම උපකාර කිරීමෙන්**
**සතුරන්ට පවා කමාව දීමෙන්**
**සෑම දෙනා වෙනුවෙන් ම කුරුසිපත් ව දිවි පිදීමෙන්**
**ප්‍රේමයේ විශිෂ්ටත්වය**
**විදහා පෑ සේක.**

**එනිසා අපි ද කිතුනුවන් ලෙස,**

**දෙවියන්වහන්සේට ප්‍රමුඛතාවය දෙමින් නිරතුරු ව ම උන්වහන්සේට ප්‍රේම කරමු.**

**අන් අයට ප්‍රේමය දක්වමින් ඔවුන් උදෙසා සීමා රහිත ව වැය වෙමු.**

**ඒ තුළින් අපි,**

**දෙවියන් වහන්සේගේ ප්‍රේමයට සාක්ෂිකරුවෝ වෙමු.**

**කටපාඩම් කරමු.**
**ශු. ලූක් 10 : 27**

ක්‍රියාකාරකම

1.පහත ප්‍රහේලිකාව නිවැරදිව සම්පූර්ණ කරන්න.




## හරහට

1. හිංසාවට පත්වූ මිනිසා .................... ජාතිකයෙකි.
2. විනයධරයා විසින් තමාගේ.................කවුදැ යි ජේසුස් වහන්සේගෙන් ඇසී ය.
3. එක් මිනිසෙක් .................... යන්නට පිටත් විය.
4. .................... ඔහුට තලා පෙළා අඩපණ කර ගියෝ ය.
5. .................... තමා නිවැරදි බව දැක්වීමට කැමති විය.
6. .................... වැටුණු මිනිසාට උපකාර කළේ ය.
7. ඔහු වැටුණු මිනිසා .................... වෙත ගෙන ගියේ ය.
8. වැටුණු මිනිසාට ඔහුගේ .................... ද අහිමි විය.

## පහළට

9. සමාරිය ජාතිකයා වැටුණු මිනිසා සිය .................... පිට නංවා ගත්තේ ය.
10. වැටුණු මිනිසා පිටත්වූයේ .................... නම් නගරයේ සිට ය.
11. ඔහු .................... බලා ගියේ ය.
12. දෙවනුව පැමිණි .................... පාරේ අනෙක් පැත්තෙන් ගියේ ය.
13. සමාරිය ජාතිකයා හිංසාවට පත් වූ මිනිසාගේ තුවාලවල.......... ගැල්වී ය.
14. අපි අන් අයට .................... දක්වමු.
15. සමාරිය ජාතිකයා තානායම්කරුට රිදී .................... දෙකක් දුන්නේ ය.
16. වැටුණු මිනිසා මුලින් ම දුටුවේ .................... ය.